# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1658/39 - 2010 ජුනි 20 වැනි ඉරිදා - 2010.06.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

නියෝග අංක : 13.

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

20 (5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20 (5) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම නිෂ්පාදකයෙකු, වෙළෙන්දෙකු, ආනයනකරුවෙකු හෝ බෙදාහරින්නෙකු විසින් කිසිදු සම්පූර්ණ යොදය සහිත කිරිපිටි වර්ගයක් පහත දක්වා ඇති උපරිම සිල්ලර මිලට වැඩියෙන් වෙළෙඳාම් කිරීම, වෙළෙඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළෙඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

| | උපරිම සිල්ලර මිල<br>රු. ශ. |
|---|---|
| සම්පූර්ණ යොදය සහිත කිරිපිටි ග්‍රෑම් 400 පැකැට්ටුව | 244.00 |
| සම්පූර්ණ යොදය සහිත කිරිපිටි කිලෝග්‍රෑම් 1 පැකැට්ටුව | 598.00 |

ඉහත දක්වා ඇති ප්‍රමාණයේ සම්පූර්ණ යොදය සහිත කිරිපිටි ඇසුරුම් හැරුණු විට අනෙකුත් ප්‍රමාණ වල සම්පූර්ණ යොදය සහිත කිරිපිටි ඇසුරුම්, ග්‍රෑම් 100 ක් සඳහා රු. 61.00 ක මිලකට වැඩියෙන් විකිණීම නොකළ යුතු ය.

සම්පූර්ණ යොදය සහිත කිරිපිටිවල උපරිම සිල්ලර මිල සම්බන්ධයෙන් 2009 නොවැම්බර් මස 09 වන දින අංක 1627/6 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග අංක 09 මෙමගින් පරිච්ඡින්න කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2010 ජුනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

07-187

1A - G 13009— 480 (2010/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.